# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## පළමු වාර පරීක්ෂණය - 2020
## First Term Test - 2020

**බුද්ධ ධර්මය** **කාලය පැය එකයි මිනිත්තු තිහයි.**

**නම / අංකය :** ........................................................................ **7 ශ්‍රේණිය**

### I කොටස

* **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **පහත දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා අදාල වාක්‍ය සම්පූර්ණ කරන්න.**

(01) බුදුන් වහන්සේට මී පිඩු හා අත්සුනු පූජා කළේ ............................................ ය.

(02) ලෝකයාට ධර්මය දේශනා කරන ලෙස ........................................................ විසින් බුදුන් වහන්සේට ආරාධනා කරන ලදී.

(03) ජටාධර තවුසන් ................................................. ලෙස හැඳින්විය.

(04) බුදුන් වහන්සේ රජගහ නුවරට වැඩම කිරීම නිසා ............................................රජුගේ ප්‍රාර්ථනා පහක් ඉටුවිය.

(05) බුදුන් වහන්සේ ................................................ට පිහිට වීම, ගිලනුන්ට උපස්ථාන කිරීම ප්‍රකට වන අවස්ථාවකි.

(පූතිගත්ත තිස්ස හිමි, දේවාචික උපාසකවරු, ජටිලයන්, බිම්බිසාර රජතුමා,සහම්පතී මහා බ්‍රහ්මයා)

- **ගැළපෙන පිළිතුරට යා කරන්න.**

| | |
|---|---|
| (06) සත් සතියේ තෙවන දින සිදුවූ අසිරිමත් සිදුවීම. | උපතිස්ස |
| (07) බුදුන් වහන්සේගේ පුරිස ධම්ම සාරතී ගුණය පෙන්වන අවස්ථාවකි. | තුන්සියයකි |
| (08) නදී කාශ්‍යපගේ පිරිස | පටිසෝතගාමිය |
| (09) සැරියුත් හිමිගේ ගිහි නම | අංගුලිමාල දමනය |
| (10) උඩුගම්බලා යාමට මග පෙන්වීම | සක්මන් කිරීම |

- **හරි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද යොදන්න.**

(11) බෞද්ධයාගේ අත්පොත ධම්ම පදයයි. (...........)

(12) විශාඛා සිටුදියණිය මිගාර මාතා නමින් ප්‍රසිද්ධ විය. (...........)

(13) නිවසට ඇතුල්වීමේදී පාවහන් ගැලවීම හොඳ පුරුද්දක් නොවේ. (...........)

(14) පස්වග තවුසන් මහණ උපසම්පදා කිරීමෙන් පසසු භික්ෂු සමාජය ආරම්භවිය. (...........)

(15) භාවනා කිරීමේ දී පුරුෂ පාර්ශවයේ නිවැරදි ඉරියව්ව අර්ධ පර්යංකයයි. (...........)

(16) බුදුන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව සිදු කළේ,
(i) පස්වග මහණුන්ට ය.
(ii) දේවාචික උපාසකවරුන්ටය.
(iii) ජටිල සහෝදරයන්ටය.
(iv) උපක ආජීවකයාටය.

(17) තෙරුවන් සරණ ගිය පළමු උපාසකයා වූයේ,
(i) බිම්බිසාර රජුය.
(ii) බරණැස් සිටුතුමාය.
(iii) යසකුල පුත්‍රයාය.
(iv) කොණ්ඩඤ්ඤ බමුණාය.

(18) බුදුන් වහන්සේ සමග කිඹුල්වත් පුරයට වැඩි පිරිස,
(i) 60 කි.
(ii) 1255 කි.
(iii) 1000 කි.
(iv) 2000 කි.

(19) ජේතවනාරාමය ඉදිකොට බුදු සසුනට පූජා කළේ,
(i) ජේත නම් කුමාරයාය.
(ii) අනේපිඬු සිටුතුමාය.
(iii) බිම්බිසාර රජතුමාය
(iv) ධනංජය සිටුතුමාය.

(20) චතුරාර්ය සත්‍යය තමන් වහන්සේ විසින් අවබෝධ කරගෙන අන් අයට කරුණාවෙන් අවබෝධ කරවීම නිසා,
(i) බුද්ධ වනසේක.
(ii) භගවා වන සේක.
(iii) ලෝකවිදූ වනසේක.
(iv) සුගත වන සේක.

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

* **ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01)
I. බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වූයේ කුමන පෝය දිනයකද? (ලකුණු 03)
II. සිදුහත් තවුසාණන්ගේ ගුරුවරු දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 04)
III. පස්වග තවුසන් නම් කරන්න. (ලකුණු 05)

(02)
I. පස්වග තවුසන් රහත්වූයේ කුමන සූත්‍රය අසාද? (ලකුණු 03)
II. ප්‍රථම රහත් හැටනම නම් කරන්න. (ලකුණු 04)
III. බුදුන් වහන්සේ හමුවීම නිසා බිම්බිසාර රජුගේ ඉටුවූ ප්‍රාර්ථනා පහ ලියන්න. (ලකුණු 05)

(03)
I. බුද්ධත්වයට පත්වූ පසු බුදුන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩියේ කුමන පොහොය දිනකද? (ලකුණු 03)
II. ප්‍රථම මහා සංඝ සන්නිපාතයට පසු සිදුවූ වැදගත් සිදුවීම් දෙකක් ලියන්න. (ලකුණු 04)
III. මිනිස් සන්තානය තුළ මෛත්‍රී සිතිවිලි ජනිත කර ගැනීම තුළින් සමාජය යහපත් වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04)
I. සිරිත් යනු මොනවාද? (ලකුණු 03)
II. හොඳ සිරිත් ඇතුළත් උපදේශාත්මක කාව්‍ය ග්‍රන්ථ දෙකක් ලියන්න. (ලකුණු 04)
III. පාසලේදී අනුගමනය කළයුතු සිරිත් පහක් ලියන්න. (ලකුණු 05)

(05)

I. බෞද්ධයන් වැඩිපුරම භාවිතයඩට ගන්නා සූත්‍ර දේශනා ඇතුළත් ග්‍රන්ථය හඳුන්වන නම කුමක්ද? (ලකුණු 03)

II. තුන් සූත්‍රයට ඇතුළත් සූත්‍ර මොනවාද? (ලකුණු 04)

III. නිවන් පතන මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග පහක් ලියන්න. (ලකුණු 05)

(06)

I. බුදු සසුනේ අග්‍ර දායකයා හා දායිකාව නම් කරන්න. (ලකුණු 03)

II. මංගල දිනට පෙර දින ධනංජය සිටුතුමා විසින් විශාකා දියණියට ලබාදුන් උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 04)

III. ආනන්ද බෝධිය ගැන කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

****